
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 6 4 6 7 8
LONDON NW3 9LS
E N G L A N D

*Phone* : 0 2 0 7 4 2 8 9 3 8 8
*Fax* : 0 8 7 1 9 0 0 5 1 6 3
*E-mail* : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam



# බිඳුණු ක්‍රිකට් සිහිනය!

**ගි**යසැරේ මා ලිව්වෙත් ක්‍රිකට් ගැන ය. අපේ ජනතාව තුළ ක්‍රිකට් කෙරෙහි ඇති උනන්දුව හා ඒනිසාම පවතින උන්මාදය ගැනය. ක්‍රිකට් අපේ ජනතාවගේ දුක් අමතකකර සිතේ මඳක් සහනය ඇති කරන බවය. අද මේ ලියන්නේ ඒ ක්‍රිකට්ම අපේ සිත් දුකින් හැඬවූ සැටි ය.

ක්‍රිකට් ලෝක ශුරතාව නිසැකවම අපට හිමිවේයයි මගේ දැඩි විශ්වාසය විය. අවසාන තරඟයට සුදුසුකම් ලබන්නට ගිය ගමනේ දී අපේ පිළ පෑ දස්කම් දුටු කල්හි ඒ මගේ නිගමනය තහවුරුකරන ක්‍රීඩා කෞශල්‍යය අප කණ්ඩායම පුරාම දැකගත හැකිවිය. අප රටේ දහස් ගණනක්ද ඒ බව දකින්නට ඇත.

එහෙත් ඒ අවසාන තරඟයට එළඹ බොම්බායේ ක්‍රීඩා පිටියට ගිය අප කණ්ඩායම තමන්ට නුපුරුදු ගමකට ආවා වැනි බයකින් ක්‍රීඩා කළ බව මුල සිටම පෙනෙන්නට තිබිණ. ඒ බය කුමක්දැයි කිසිවෙකුට නොතේරේ. ලොව පුරා ක්‍රීඩා පිටිවල ක්‍රීඩාකොට ඇති අපේ ක්‍රීඩක-යින් එදා ක්‍රීඩාකළේ තමාට තමා විශ්වාස නැති සෙයක් සහ බයක් ද ප්‍රකට කරමිනි.

කාසියේ වාසිය දිනා මුලින්ම පන්දුවට පහර දෙන්නට ශ්‍රීලංකාව තීරණය කළා නම් පළපුරුදු උපුල් තරංග හා දිල්ෂාන් ඔවුන්ට සුපුරුදු ප්‍රහාරක ශෛලියෙන් තරඟය අරඹන් නට තැත් නොකළේ ඇයි. උපුල් තරංග ලකුණු 2 කට දැවී ගිය පසු පැමිණි සංගක්කාර වුව ද වෙනදා පෙන්වන කැපී පෙනෙන දක්ෂතාව පෙන්නුම් කළේ නැත. ඔහු වඩාත් මන්දගාමී වූයේය. ඕවර 10 කදී ඔහුත් දිල්ෂානුත් යන දෙදෙනා රැස්කළේ ලකුණු 9 කි. එය ඇදහිය හැකිද? මීට පෙර 97 ලෝක කුසලාන තරඟ වල ජයසූරිය හා කළුවිතාරණ දෙපොළ එංගලන්තයට ඕවර් 10 ක දී ලකුණු 100 කට ආසන්න ගණනක් ගැසූ හැටි අපට මතක්වෙයි. කෝ ඒ ජවය? කෝ ඒ කැපවීම? කෝ ඒ තරහ? එහෙත් මෙදා සටන ආරම්භ කළ දෙදෙනාගේ ක්‍රීඩාව බලා සිටින්නට බැරි තරම් කණගාටුදායක වූයේය. අපේ පරාදය එතැන ය. අවසානයේ මහේලගේ නොදැවී ශතකයට පවා අපේ පරාජය වළක්වා ගන්නට බැරිවිය.

ඊළඟට ඇසිය යුතු ප්‍රශ්නය නම් ක්‍රිකට් තේරීම් කමිටුව අවසාන තරඟයට පළපුරුදු නැති රන්දිව්, කපුගෙදර හා තිසර පෙරේරා ගෙනගියේ ඇයි? අවසාන තරඟයකට යැවිය යුතු නියම කණ්ඩායමක් තෝරාගන්නට තරම් මොළයක් තේරීම් කමිටුවට නොතිබූ බව පෙනේ. ලෝක කුසලානය දිනන්නට නොව පරදින්නට ඔවුන් වෑයම් කළේ දැයි නොදනිමි.

පන්දු රැකීමට පිටියේ අපේ ක්‍රීඩකයින් යොදවා තිබූ ආකාරය අන්තිමය. එය නායකයා-ගේ වගකීමයි. ඉන්දියාව කිසි ගණනක් නැතිව අපේ ක්‍රීඩකයින් අතරින් පන්දුව රිංගා යන්නට පහර දුන්නේය. ඒ පන්දු රැකගන්නට අපට කොහෙත්ම බැරි විය. ඒ නිසාම ඉන්දියානුන්-ගේ පිති ප්‍රහාරය ද වේගවත් විය. එය අපට සරදම් කරන්නාක් මෙන් විය. අපේ පන්දු යැවීමද දුර්වලය. ඉන්දියානුවන් දවාගන්නට අප ගත් ප්‍රයත්න සියල්ල නිෂ්ඵල විය. ඉන්දියානු පිළ දිනුවා නොව ඔවුන්ට දිනා ගන්නට ඉඩදී අපි ගෙදර ආ බව පමණක් කිව හැකි ය.

# හිරු වෙනුවෙන් පවත්වන මහා උළෙල



චිත්‍රය - කුමුදු ගුණවර්ධන

**ලෝ**කයේ බොහෝ ජාතීහු සූර්යයා මුල් කරගෙන උත්සව පවත්වති. ලාංකික යින් ඇතුළු පෙරදිග ජාතීන් සූර්යයා මුල්කරගත් එම උත්සවයන් පවත්වන්නේ නව අවුරුදු උත්සවයක් ලෙසිනි. සිංහල අවුරුදු උත්සවය සූර්යයා මීනරාශියෙන් මේෂ රාශියට සංක්‍රමණයවීම නිමිති කර ගෙන පවත්වනු ලබන්නකි. ඒ අනුව බලන කල දවස් තුන්සිය හැට පහක් ගෙවී වසරක් සම් පූර්ණවීම සැමරීමේ සංවත්සර උත්සවය ද වන්නේ ය.

මිනිසුන් හිරු මුල් කරගෙන උත්සව පවත්වන් නේ ඇයිද යන්න සොයා බැලිය යුතු කරුණකි.

මුළු මහත් ලෝක යේම සෑම කටයුත්-තක් සඳහාම බලපෑ මක් කරන්නේ සූර්යයාය.

කොටින්ම මේ පෘථු විය සෑදී ඇත්තේද සූය්‍යයාගේ කොටසක් කැඩී යැමෙනි. එම කැඩීගිය කොටස ක්‍රමයෙන් සිසිල්ව එහි ගහ කොළ සත්වයින් බිහිවී මානවයින් ඇතිවූ පසු බුද්ධියෙන් වැඩි වූ මානව වර්ගයා පෘථුවියත් සූර්යයාත් අතර ඇති දැඩි සබඳතාව තේරුම් ගත්හ. ඒ අනුව ආදීම මිනිසා සූය්‍යයා තමා කෙරෙහි බැල්ම හෙලා සිටින දෙවි කෙනෙකැයි සිතා පුද පූජා කළේ ය. හිරු ඇදහීම ඇතිවූයේ ඒ ලෙසිනි. ඒ අනුව හිරු දෙවියා පිදීම සිංහලයන්ගේ ඉපැරණි ඇදහිලි ක්‍රමයක් වීය.

සූර්යයා මිනිසා කෙරෙහි බලපාන ස්වාභාවික තත්වය තේරුම් ගෙන හෝ නොගෙන එසේ ඇරඹුණු පුද පූජා නිසා හිරු මුල්කරගෙන පවත්වන උත්සව ලෝකය පුරා ව්‍යාප්තව ඇත. එපමණක් ද නොව පසු කාලීනව ඇති වූ ආගම් සම්බන්ධ කරගෙන පවත්වන උත්සවයන් ද සංවිධානය වී ඇත්තේ සූය්‍යයා පදනම් කරගෙන ය.

හින්දූන්ගේ තෛපොංගල් උත්සවය සූර්යයා මකර රාශියට සංක්‍රමණය වීම නිමිතිකරගෙන පවත්වන්නකි. ඇසළ මස පවත්වන දෙව් කෙළි සූර්යයා සිංහ රාශි ගතවන කාලය තුළ පැවැත්වේ. සූර්යයා ඇදහූ ග්‍රීක්වරු දෙසැම්බර් 24 වෙනි දා සූර්යයා අභාවයට යන දිනය ලෙස සැලකූ අතර දෙසැම්බර් 25 වන දින යළි උපත ලබන දිනය ලෙස සැලකූහ. මෙම නිසා ක්‍රිස්තු භක්තිකයෝ ක්‍රිස්තු උපත වෙන දිනයක සිදුවුවත් දෙසැම්බර් 25 වන දා නත්තල් උත්සවය පවත්වති. එසේම සබත් දිනය ලෙස මුලින් සලකන ලද්දේ සෙනසුරාදා වුවත් හිරු දෙවියන්ට වෙන්වූ දිනය වූ ඉරිදා ඒ සඳහා යොදාගනු ලැබී ය.

බුදු දහම හා හිරු ඇදහීම අතර ද සම්බන්ධයක් පවතී. බුද්ධාගමේ පුද පූජා අතර පහන්පූජාවට විශේෂ තැනක් ලැබේ. ලොව ඇති ලොකුම පහන සූය්‍යයායි. පහන සත්‍යයේ සංකේතයකි. සත්‍යය පදනම් කරගත් බෞද්ධ ධර්මය ස්කන්ධ වශයෙන් අසූහාර දහසකි. අසූහාර දහසේ පහන් පිංකම් ආදිය කෙරෙහි බලපා ඇති සංකල්පය සූර්යයා ඇදහීම විය හැකි ය.

පසු කාලීන විද්වතුන්ද සූර්යයා සහ මිනිසා අතර ඇති සම්බන්ධය ගැන සඳහන් කර තිබේ. ඇරිස්ටෝටල් කියා ඇත්තේ සූර්යයා හා මනුෂ්‍යයා නිසා මනුෂ්‍ය සම්භවය සිදුවන බවයි. සප්‍රාණිකවූ සියල්ලේ පීතෘවරයා සූය්‍යයා බව මහා කවි මිල්ටන් සඳහන් කළේ ය.

## ලොව ඇති ලොකුම පහන සූර්යයාය. පහන සත්‍යයේ සැබෑ සංකේතයයි !

හිරු පාලනයේ ද පීතෘවරයා වීය. එම නිසා පසු කාලීනව බලය ලබා ගත් පාලකයෝ තමන් හිරුගෙන් පැවත එන බව දැක්වූහ. මේ අනුව මනුරාජ පරම් පරාව **සූර්ය වංශෝද්භූත** විය. එසේ සඳහන් කරගත්තේ ජනතාවගේ පක්ෂ-පාතිත්වය ලබා ගැන්ම සඳහා ය.

සූර්යයා මුල්කරගෙන අවුරුදු උත්සව පවත්වන පෙරදිග ජාතීහු අප්‍රියෙල් මස මැදට යෙදෙන විශේෂ දිනයක් ඒ සඳහා යොදා ගත්හ. එම දිනය සමාන රාත්‍රි හා දවල් ඇතිවන දිනයයි. භාරතීයයන් මේදින පැවැත් වූ උත්සවය හඳුන්වන්නේ **විෂුවෝත්සවය** කියායි. රෑ දාවල් දෙකේ සමානතාව නිමිති කරගෙන කරනු ලබන උත්සවය යන්න එහි අදහසයි. මෙම දිනය අප්‍රේල් මස 13 ට හෝ 14 ට යෙදේ. මෙලෙස සියළුම ජාතීන් පවත්වන නව අවුරුදු උළෙල ඒ ඒ ජාතීන්ගේ ආගමික හා සාමාජීය පසුබිම අනුව විවිධ ස්වරූප ගෙන ඇති බව පෙනේ.

මෙයට අවුරුදු 5000 කට පමණ පෙර දියුණු ශිෂ්ටාචාරයකට නෑකම් කියූ යුප්‍රටීස් ටයිග්‍රීස් දෙගම් මැද විසූ සුමේරි යානුවරුනුත්, නයිල් නිම්න ශිෂ්ටාචාරය ගොඩ නැගූ මිසරවරුනුත් උත්කෘෂ්ට ලෙස අවුරුදු උත්සව පවත්වා තිබේ. ඒ පිළිබඳ කරුණු සෙවූ විද්වතුන් දක්වා ඇත්තේ එම උත්සවයන්ට මූලික වූයේ පරිසරය බවයි. මෙහි ප්‍රධාන සාධකය හිරු ය. හිරුගේ වාර්ෂික ගමන් කිරීම අනුව ශීත, වසන්ත, ග්‍රීෂ්ම, සරත් සෘතු විපර්යාස සිදුවන බව සොයා ගත්හ. පසුව ඊට අනුරූපව ලිත් සාදන ලදී. එය අවුරුදු උත්සවයන්ට මග පෑදී ය. උත්සව ආරම්භ වන්නේ ශීත සෘතුව ගෙවී වසන්ත සෘතුව ආරම්භයත් සමග ය. ශීතල ගෙවී වසන්තය උදාවීම ප්‍රීතියට කරුණකි. මේ නිසා ඔව්හු හිරුට ගරු කිරීමත් තම ප්‍රීතිය පළකිරීමත් පිණිස උත්සව පැවැත්තුවෝ ය.

සිංහල අවුරුදු උත්සවය දෙස බලන විට එහි ස්වරූපය බොහෝ සෙයින් මකර සංක්‍රාන්ති උත්සවය හා සමාන වේ. නැකතට අළුත් බත් පිස පුද සිරිත් පවත්වා අග්නි දෙවියන් පිදීම හින්දූන්ගේ සිරිතකි. සිංහල අවුරුදු උත්සවය ද සම්පූර්ණයෙන් සිදුවන්නේ නැකැත්වලට මුල්තැන දීමෙනි.

♦ **විජේරත්න අතුරුපාන**
**Sri Lanka**

# ✻ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✻

## හිතොපදේශයෙන්

**නිර්ධනශ්චාපි කාමාර්ථී - දුර්බල කලහප්‍රිය**
**මන්දශාස්ත්‍රො විවාදාර්ථී - ත්‍රිවිධං මූර්ඛලක්ෂණම්**

**අර්ථය** : *වස්තු නැතිවත් පංචකාම සම්පත්තීන් අනුභවයට සිතන තැනැත්තේද, කායබලාදී සහාය බලයක් නැතිව දබරකරන අභිප්‍රාය ඇත්තේද, වැඩි අකුරු ශාස්ත්‍රයක් නැතිව අනුන් හා වාදකරනු කැමැත්තේද යන මෙකී තුන්දෙනා අඥානයෝ වන්නාහ.*

මෙයින් විස්තර කරනුයේ අපේ ජීවිතයේ අප සිදුකරගන්නා අඥාන ක්‍රියාවන් තුනකි. මින් පළමුවැන්න- පසුකම් සුවවිදීමට තරම් සම්පත් තමා ළඟ නැතත් අසීමිත ලෙස පස්කම් සුව විඳීමේ අධික ආශාව ඇතිවීම, කාය බල ඥාන බල හා සේනාබල සහායක් නැතිව අනුන් හා කලකෝලාහල කිරීමේ අදහසින් යුක්තවීම සහ ප්‍රමාණවත් තරම් ඒ ඒ විෂය පිළිබඳ දැනුම නැතිව අනුන් හා වාදකිරීමේ කැමැත්තයි.

යමෙක් මෙලොව ඉපිද ළදරුවිය ඉක්මවා ඉන්ද්‍රියයන් මුහුකුරායාමෙන් පස්කම් සුව අත්දැකීමේ හැකියාව ලබයි. රූප ශබ්දාදී අත්දකින අරමුණුවල ප්‍රිය දේ කෙරෙහි ඇලෙයි. සුව විඳනා කෙරෙහි සතුටුවෙයි. අසතුටු දේ කෙරෙහි විරෝධතා හැඟීම් ඇතිකරගනී.

කෘතිම උපකරණ කෙරෙහි පූර්ණ විශ්වාසය තබා ඒ මතම යැපීමට උත්සාහ දරණ වත්මන් සමාජය ඉන් මිදීමට හිතන්නේ නැත. මේ නිසාම අලස, කුසීතකම ඉහවහා ගොස් ස්වශක්තිය මත විශ්වාසය නොතබා, උත්සාහය පසෙක ලා වක්‍ර මාර්ගවලින් ධනය ඉතා ඉක්මනින් ඉපයීමේ මිනිස් අභිප්‍රාය නිසාම සමාජ ගැටළු ඉහළ දිනෙන් දින යමින් පවතී. කය පිනවීම බැහැරකිරීමට ඇති අකමැත්ත නිසාම තම ආවේගයන් පාලනය කරගත නොහැකි බොහෝ දෙනා මාධ්‍ය මගින් කෙරෙන ප්‍රචාරක පෙළඹවීම් වලට වහල්වී, අනුකරණ යන්ට ඇබ්බැහිවීමෙන් අයවැය තුලනය කරගැන්මට නොහැකිව තම පවුල තුළ මෙන්ම බාහිරවද ගැටුම් ඇතිකර ගනිති.

කෙනෙකුගේ පැවැත්ම සඳහා මනසේ පවතින ස්වභාව දෙක වන්නේ කැමැත්ත හා අකමැත්තයි. පැවැත්ම සඳහා ආහාර පාන ඇඳුම් පැළඳුම් සඳහා ඇතිවන කැමැත්ත පාපය-ක් නොවේ. එහෙත් ගැටළුව වන්නේ එහි සීමාන්තික බවයි. අප අකමැති දේවලද සීමාවක් නැත. කොතරම් ආශාව තිබුණත් ඒවා ලබාගැන්මට බැරිවූ විටත්, කොතරම් අකමැති වුනත් ඒ අකමැති සියල්ල දුරුකරගැන්මට බැරිවුණ විටත් අපි අසහන යට පත්වන්නෙමු. මෙය ජීවිතයේ අසාර්ථකත්වයට හේතුවෙයි.

ජීවිතයේ ඇති සංකීර්ණබව අවමකර ගැන්මට උපකාරීවන්නේ සරළ දිවිපෙවතකි. වත්මන් සමාජය තුළ වාණිජ ලෝකය විසින් මවනු ලබන කෘතිම භාණ්ඩ ජනතාවට අත්‍යවශ්‍ය දේ ලෙස පෙන්නුම් කෙරේ. එහෙත් ඒ දේට ඇබ්බැහි නොවී තමනට අවශ්‍ය ප්‍රමාණයට ඒ භාණ්ඩ අවශ්‍ය නම් පරිහරණය කළ යුතුවෙයි.

තම තරමද, අනුන්ගේ තරමද නොදන්නා බොහෝ දෙනා අනවශ්‍ය වාදවිවාදවල පැටලී කලකෝලාහල කරගැන්ම අනුවණකමකි. එය තම තරම ගැන ඇත්කරගන්නා අධි තක්සේරුව මුල්කරගත් මානය ලෙස ඇතිවන චිත්තාවේගයකි.

මහායාන පඬිවරයෙකුගේ අදහස් දෙකකින් මෙම සටහන අවසන් කරනු කැමැත්තෙමි.

ලද දෙයින් සතුටුවීම ස්වාභාවික ධනයයි. පමණ ඉක්මවා වියදම්කිරීම මිනිසා විසින් තනනු ලබන දුප්පත්කමයි. අලස-කම නොපෙනෙන අනතුරයි. අධ්‍යාත්මික දියුණුව කෙනෙකුට ඇති අසීමිත ධනයයි.

2 යමෙක් ඔබට නපුරු ලෙස බැණවදින විට පළිගැනීමක් නොකර නිශ්ශබ්දවන්න. ඔබට අවහිර බාධාකරනවිට සිතේ සාමය ඇතිකරගන්න. කෙනෙක් ඊර්ෂ්‍යාකරන විට හා ඔහු ඔබ හා තරහින් සිටිනවිට මෙත් පතුරන්න. නින්දා අපහාස කරන විට කෙළෙහිගුණ සැලකීමක් ලෙස ඔවුන්ගේ කිසියම් ගුණයක් සිහිකරන්න.



♦ *රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති*
**පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි**
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**
**The Avenue, London W4 1UD**

**NORMA & Co**
**Associate Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772 / 07717173414**

**Any type of Visa Applications**
**Car Accidents**

***Colombo Office***
**Visa Applications & Any Refusals**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**